දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය - Faculty of Humanities & Social Sciences

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) පරීක්ෂණය - 2020 (පුනර් 2016) - 2022 පෙබරවාරි / මාර්තු
First Examination in Arts (External) - 2020 (Repeat 2016) – February / March 2022

සවිප්‍ර 1.2 - දකුණු ආසියාව තුළ ශ්‍රී ලංකා සමාජය
SGY 1.2 – Sri Lankan Society in South Asia

කාලය පැය (03) තුන යි.

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න. පැහැදිලි අත් අකුරින් පිළිතුරු සැපයිය යුතු ය.

---

1. දකුණු ආසියාව සංස්කෘතිකමය වශයෙන් සුවිශේෂී උප කලාපයක් වශයෙන් හඳුනා ගනු ලබන්නේ කවර සමාජ, සංස්කෘතික, ආර්ථික සහ දේශපාලනික ලාක්ෂණිකයන් මුල් කොට ගෙනදැයි නිසි නිදසුන් සහිතව පෙන්වා දෙන්න.

(ලකුණු 20)

2. දකුණු ආසියානු සමාජවල පවතින දීර්ඝ ඉතිහාසයක් සහිත ආගමික විශ්වාසයන් පුද්ගලයන්ගේ අනන්‍යතාව ගොඩ නැගීමට හේතු වන්නේ නමුත්, විවිධ ආගමික කණ්ඩායම් අතර මූලධර්මවාදී අරගල නිර්මාණය වීම දකුණු ආසියානු සමාජ මුහුණ දෙන ප්‍රධාන අභියෝගයක් බවට පත් වී ඇත්තේ කෙසේදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

3. ශ්‍රී ලංකාවේ සමාජ සහ සංස්කෘතික තත්ත්වයන් තීරණය වීම කෙරෙහි ඉන්දියානු සමාජ යථාර්ථයන් බලපෑම් කොට ඇති ආකාරය යෝග්‍ය නිදර්ශන දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 20)

4. ඔබේ අත්දැකීම් ද උපයෝගී කොටගෙන ශ්‍රී ලංකා සමාජය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින්, දකුණු ආසියාවේ ග්‍රාමීය සමාජය මුහුණ දෙන අභියෝග පිළිබඳ විශ්ලේෂණයක් ඉදිරිපත් කරන්න.

(ලකුණු 20)

5. "කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ශ්‍රී ලංකාවේ බොහෝ ග්‍රාමීය තරුණ කණ්ඩායම් විදේශ රටවලට සංක්‍රමණය වීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරයි. මෙයට ප්‍රධාන හේතුව වන්නේ දේශපාලන අස්ථාවරත්වය සහ පුද්ගලයාගේ පරිභෝජන රටාවේ පවතින අතාර්කික භාවයයි" මෙම ප්‍රකාශය සමග කෙතෙක් දුරට එකග වන්නේ දැයි ඔබේ අත්දැකීම් ද උපයෝගී කොටගෙන සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

6. දකුණු ආසියාව පෙරදිග ලෝකයේ දැනුම් කෝෂ්ඨාගාරයක් යැයි ඒ. එල් බෂාම් සඳහන් කරයි. කලාව, භාෂාව, වෛද්‍ය ශාස්ත්‍රය, අධ්‍යාපන ක්‍රමය, ඉංජිනේරු විද්‍යාව වැනි ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරමින්, දකුණු ආසියානු සමාජයේ තිබෙන විවිධ දැනුම් සම්ප්‍රදායන් පිළිබඳ රචනයක් ලියන්න.

(ලකුණු 20)

7. දකුණු ආසියාවේ බොහෝ රටවල නාගරික සමාජයන් වේගයෙන් නවීකරණය වුවත්, ශතවර්ෂ ගණනාවක් තිස්සේ පවත්වා ගෙන එනු ලබන චර්යා සම්ප්‍රදායන් තව දුරටත් පුද්ගලයාගේ දෛනික ජීවිතය හා සම්බන්ධ වී ඇති ආකාරය යෝග්‍ය නිදර්ශන සහිතව පෙන්වා දෙන්න.

(ලකුණු 20)

8. පහත සඳහන් මාතෘකාවලින් <u>දෙකකට (02)</u> අදාල ව සටහන් ලියන්න.

අ. මනස යටත්විජිතකරණයට භාජනය වීම
ආ. පවුල කේන්ද්‍රීය සමාජ ක්‍රමය
ඇ. විවාහය ආගමික පරිකර්මයක් වශයෙන්
ඉ. ග්‍රාමීය තරුණයන්ගේ ව්‍යවසායකත්වය
උ. බුදු දහම සහ වර්තමාන ශ්‍රී ලංකාවේ දේශපාලනය

(එක් සටහනකට ලකුණු 10 බැගින් ලකුණු 20)

*********************